# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය

## නාට්‍ය හා රංග කලාව ශාස්ත්‍රපති (එක් අවුරුදු) උපාධි පාඨමාලාව 2015/16 වර්ෂය සඳහා අයදුම්පත් කැඳවීම

පූර්වෝක්ත ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම පිණිස 2015 නොවැම්බර් 10 දක්වා අයදුම්පත් නිකුත් කරනු ලැබේ. මෙම පාඨමාලාවට අදාළ දේශන ඉරිදා දිනවල සිංහල මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ.

**ලියාපදිංචිය සඳහා සුදුසුකම්:** පිළිගත් විශ්වවිද්‍යාලයක ප්‍රථම උපාධිය

**පාඨමාලා ගාස්තු** : රු. **60,000.00** (මීට ආපසු ගෙවනු ලබන රු.5000.00/- ක පුස්තකාල ගාස්තුවක් ද ඇතුළත් ය.) පාඨමාලා ගාස්තු රු. 35,000/- සහ රු. 25,000.00/- බැගින් වූ වාරික දෙකකින් ගෙවිය හැකිය.

**අයදුම් කරන ආකාරය:**

මහජන බැංකුවේ කැලණිය ශාඛාවේ අංක 055-1-001-1-0667549 දරන කැලණිය විශ්වවිද්‍යාලයීය ගිණුමට බැරවන සේ මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට රු. 750.00/-ක මුදලක් ගෙවා ලබාගත් බැංකු රිසිට්පත සමග නම හා ලිපිනය ලියූ රු. 10.00 ක් වටිනා මුද්දර ඇලවූ 9"x4" ප්‍රමාණයේ ලියුම් කවරයක් **ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය** වෙත එවීමෙන් ලබාගත හැකිය. අදාළ අයදුම්පත www.kln.ac.lk/fgs යන වෙබ් අඩවියෙන්ද ලබාගත හැකි අතර එසේ ලබා ගන්නා අයදුම්පත් මහජන බැංකුව වෙත රු.750.00/- ක් ගෙවා ලබාගත් රිසිට් පත සමඟ ඉහත ලිපිනයට බාර දීමට හෝ තැපැලෙන් එවීමටද හැකියාව ඇත.

සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2015.11.18** දිනට පෙර ඉහත ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් හෝ පැමිණ බාරදිය හැකිය. අයදුම්පත් බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "නාට්‍ය හා රංග කලාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව– 2015/16" යනුවෙන් සඳහන් කළ යුතු වේ.

අසම්පූර්ණ හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේඛකාධිකාරී**<br>
**කැලණිය විශ්වවිද්‍යාලය,**<br>
**කැලණිය.**

2015.09.21 දින.